සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 40 S I

# පෙරදිග සංගීතය

කාලය පැය එකයි

සැලකිය යුතුයි :- ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
● ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. සප්තකයෙහි ඇති චල ස්වර ගණන
(1). 2 කි. (2). 4 කි. (3). 5 කි. (4). 7 කි.

02. මගමරි, ගපධනිස් ආදී වශයෙන් ස්වර සංගති යෙදෙන රාගය වනුයේ,
(1). යමන් (2). බිලාවල් (3). කාෆි (4). භූපාලි

03. ග-ධ සහ ධ-ග වාදී සංවාදී වන රාග යුගලය පිළිවෙලින්,
(1). බිලාවල්- භූපාලිය. (2). භූපාලි - යමන්ය. (3). යමන් - බිලාවල්ය. (4). භූපාලි - බිලාවල්ය.

04. භෛරවී රාගයට අදාළ වන ප්‍රකාශය තෝරන්න.
(1). රාත්‍රී කාලයෙහි ගැයෙන රාගයකි. (2). සර්ව කෝමළ රාගයකි.
(3). පංචමය සහ ධෛවතය වාදී සංවාදී වේ. (4). සරිමපධ යන ස්වර අනුවාදී වේ.

05. රාත්‍රී ප්‍රථම ප්‍රහරයෙහි ගැයීමට සුදුසු නිර්දේශිත රාග යුගලය වනුයේ,
(1). යමන් - භූපාලි (2). කාෆි - භෛරවී (3). බිලාවල් - භූපාලි (4). යමන් - කාෆි

06. මධ්‍යමය සහ සඩ්ජය වාදී සංවාදී වන රාගය වන්නේ,
(1). කාෆි (2). බිලාවල් (3). භෛරවී (4). යමන්

07. සරි ගප ගරි සරි / ගපධස් ධප ගරි
සරි රිග ගප ධප / ගප ගරි ගරි ස -

ඉහත සඳහන් තානාලංකාරය අයත් රාගය වනුයේ,
(1). යමන් (2). භූපාලි (3). බිලාවල් (4). කාෆි

08. සර්ව කාලීනව ගැයීමට සුදුසු රාගය වන්නේ,
(1). යමන් (2). කාෆි (3). භූපාලි (4). භෛරවී

09. නිර්දේශිත රාග අතුරෙන් ඖඩව ජාති රාගය වන්නේ,
(1). කාෆි (2). භූපාලි (3). යමන් (4). භෛරවී

10. භෛරවී රාගයෙහි වාදී සංවාදී ස්වර වනුයේ,
(1). ස ම (2). ප ස (3). ම ස (4). ස ප

11. මාත්‍රා ගණනින් සහ ඡේකාවෙන් සමාන වන තාල යුගලය වන්නේ,
1. ජප් තාල් - දීප් චන්දි 2. කෙහෙර්වා - ලාවනී
3. දාදරා - බෙම්ටෝ 4. ත්‍රිතාල් - කෙහෙර්වා

12. සුළු මැදුම් දෙතිතට හා මැදුම් මහ දෙතිතට සමාන හින්දුස්ථානී තාල යුගලය පිළිවෙලින්,
1. ජප් තාලය - දීප්චන්දි 2. දීප්චන්දි - ලාවනී
3. ජප් තාලය - ත්‍රිතාල් 4. ලාවනී - කෙහෙර්වා

13. ධ ම ධ නි ස් - ස්ස් ආදී වශයෙන් අන්තරා ආරම්භ වන රාගය වන්නේ,
(1). කාෆි (2). භෛරවී (3). යමන් (4). භූපාලි

14. ම ම ප ධ / නි නි ස් - ස් / කාෆි රාගයට අනුව මෙහි නි ස්වරය හඳුන්වන්නේ,
(1). විකෘති ස්වරය ලෙසයි. (2). වර්ජිත ස්වරය ලෙසයි.
(3). අනුවාදී ස්වරය ලෙසයි. (4). විවාදී ස්වරය ලෙසයි.

15. දිනයේ ප්‍රථම ප්‍රහරයෙහි ගැයෙන රාගය වන්නේ,
(1). බිලාවල් (2). යමන් (3). කාෆි (4). භූපාලි

16. භෛරවී රාගයෙහි යොදා ගනු ලබන විවාදී ස්වර වන්නේ,
(1). රි ග ධ නි (2). රි ග ම ධ නි (3). රි ග ම් ධ නි (4). රි ග ප ධ නි


17. සස රිරි ගු ගු මම / පම ගුම ගරි ස - / ලෙස තානාලංකාර යෙදෙන රාගය වන්නේ,
(1). යමන් (2). කාෆි (3). භෛරවී (4). බිලාවල්

18. තබ්ලා බායාං හි නිකුත් කරන "ගෙ" අක්ෂරයත්, දායාං හි නිකුත් කරන "තා" අක්ෂරයත් එකවර වාදනය කිරීමෙන් උපදින අක්ෂරය වන්නේ,
(1). ධිං (2). ධෙන් (3). ධා (4). දිං

19. " කලණ මේල ගත පිරුණු නිස ගැයෙන " යන ලක්‍ෂණ ගී පාදයෙන් කියවෙන රාග ලක්‍ෂණ වන්නේ,
1. කල්‍යාණ මේල ගත සම්පූර්ණව ගැයෙන රාගයක් බවය.
2. කල්‍යාණ මේල ගත සම්පූර්ණ නිසා ගැයෙන රාගයක් බවය.
3. කල්‍යාණ මේල ගත ෂාඩව නිසා ගැයෙන රාගයක් බවය.
4. කළණ මේල ගත සම්පූර්ණ රාගයක් මෙන්ම රාත්‍රී කාලයේ ගැයෙන රාගයක් බවය.

20. තබ්ලාවේ දහිනා කොටසෙහි අක්ෂර උත්පාදනය කරගනු ලබන්නේ,
1. ලවය, මෛදාන් සහ ස්‍යාහි යෙනි. 2. චාන්ටි, ලවය සහ ස්‍යාහියෙනි.
3. ස්‍යාහි, චාන්ටි සහ ගජරා වෙනි. 4. චාන්ටි, ස්‍යාහි සහ බද්ධි වලිනි.

❖ **පහත සඳහන් රූපය ඇසුරින් 21 සිට 24 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




21. භූපාලි රාගයෙහි අවරෝහණයට අදාළ ස්වර වලට හිමි අංක වන්නේ,
(1). 13, 10, 8, 5, 3, 1 (2). 1, 3, 5, 6, 10,13 (3). 13, 10, 6,5, 3, 1 (4). 1, 3, 5, 8, 12, 13

22. ස රි ග ම යන ස්වර 4 මධ්‍යම භාවයෙන් වාදනයේදී උපයෝගී කරගනු ලබන යතුරු වලට හිමි අංක වනුයේ,
(1). 6, 8, 9, 12 (2). 6, 8, 10, 11 (3). 6, 10, 12, 13 (4). 6, 8, 11, 12

23. F minor Chord එකට වාදනය කළ යුතු යතුරු වලට හිමි අංක වන්නේ,
(1). 6, 7, 10 (2).6, 9, 13 (3). 6, 8, 12 (4). 6, 10, 13

24. C minor Scale එකට අයත් යතුරු වලට හිමි අංක වන්නේ,
(1). 1, 2, 5, 6, 8, 9, 10, 12 (2). 1,3, 5, 6, 8, 10, 12, 13
(3). 1, 2, 4, 6, 8, 9, 11, 12 (4). 1, 3, 4, 6, 8, 9 සහ 11, 13

25. "රතු හැට්ටකාරී" නාට්‍යයේ එන ගීයකි.
1. සෝබාවදේ මෙපුර 2. යස ඉසුරු පිරුණු 3. අපි කිරිල්ලියෝ 4. රතදර සිරියා පරදන

26. කෝකිල වන්නම ගායනා කරනු ලබන්නේ,
1. මැදුම් තනි තිත හා දෙසුළු මැදුම් තුන්තිත අනුවය. 2. මැදුම් තනි තිත හා සුළු මැදුම් දෙතිත අනුවය.
3. මැදුම් මහ දෙතිත හා දෙසුළු මැදුම් තුන් තිත අනුවය. 4. මැදුම් මහ දෙතිත හා සුළු මැදුම් දෙතිත අනුවය.

27. බෙර පදය, තානම, කවි හා ඉරට්ටිය වශයෙන් කොටස් හතරකට බෙදෙනුයේ,
1. උඩරට වන්නම් වලය. 2. පහතරට සින්දු වන්නම් වලය.
3. සබරගමු වන්නම් වලය. 4. උඩරට ප්‍රශස්ති වලය.

28. "මනමත් කරවන දනමුළු දෙරණා" මෙම පැදි පාදයේ එන සඳැස්මත් ගණන කීයද?
1. 15 කි 2. 14 කි 3. 13 කි 4. 16 කි

29. "ගම අවුලක්ඍං, මේ අවුරුදු කාලේ සහ වන්නම් සවුදම්" ආදී ජන සංගීත ආශ්‍රිත ගීත නිර්මාණය කළේ,
1. සී.ද.එස්. කුලතිලක මහතාය. 2. ලයනල් රංවල මහතාය.
3. රෝහණ බැද්දගේ මහතාය. 3. ඩබ්.බී. මකුලොලුව මහතාය.

30. සී.ද.එස්. කුලතිලක මහතා විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් නොවන්නේ,
1. ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය 2. විශ්ව සංගීත ක්ෂේත්‍ර
3. හෙළ ගී මග 4. ජන සංගීත සිද්ධාන්ත

❖ 31 සිට 34 දක්වා ප්‍රශ්න වලට පහත සඳහන් රූප සටහන් උපයෝගී කරගන්න.


A


B


C


D


E

31. ප්‍රධාන තත් 7 කින් යුතු සංගීත භාණ්ඩය වන්නේ,
    1. D ය. 2. C ය. 3. B ය. 4. A ය.

32. B සංගීත භාණ්ඩයේ තත් නම් කරනුයේ,
    1. G, D, E, A, B, E ලෙසය. 2. G, D, A, E ලෙසය.
    3. E, A, D, G, B, E ලෙසය. 4. G, A, B, E ලෙසය.

33. C සංගීත භාණ්ඩයේ සිහින් තතේ සිට මහත තත දක්වා නම් කරනුයේ,
    1. E ,A, D , G, B, E ලෙසය. 2. G, B, E, D, A, E ලෙසය.
    3. E, B, G, D, A, E ලෙසය. 4. D, A, E, G, B, E ලෙසය.

34. E සංගීත භාණ්ඩයේ වාදනය කරනු ලබන වාද්‍ය අංග වන්නේ,
    1. කායදා, මුඛඩා, පරන්, චක්‍රධාර්ය 2. කායදා, පරන්, ජලා, මුඛඩාය.
    3. කායදා, පල්ටා, ජලා, පරන්ය 4. කායදා, පරන්, ස්ථායි, ජලා ය.

35. මුල් යුගයේ චිත්‍රපට සංගීත අධ්‍යක්ෂවරයෙකු නොවන්නේ,
    1. මොහොමඩ් ගවුස් ය. 2. එඩී ජයමාන්න ය.
    3. ආර්. මුත්තුසාමි ය. 4. ආනන්ද සමරකෝන් ය.

36. රේඛාව චිත්‍රපටයේ එන ගීයකි,
    1. රන් වන් දුල් කරලින් 2. මනරංජන දර්ශනීය
    3. ආදර නදිය ගලා 4. වෙසක් කැකුළු අතු

37. Magnitude යනුවෙන් බටහිර සංගීතයේ දී හඳුන්වන්නේ නාදයේ කවර ගුණය ද?
    1. නාදයේ උස් පහත් බව යි. 2. රූප භේදය යි.
    3. උච්ච නීච භේදය යි. 4. ධ්වනි ගුණය යි.

38. නාඩගම් සඳහා භාවිතා වන්නේ කුමන තාල වාද්‍ය භාණ්ඩය ද?
    1. තබ්ලාව 2. මද්දලය 3. යක් බෙරය 4. මෘදංගය

39. සංගීතමය නාද කිසියම් විද්‍යුත් අංකිත ක්‍රමයකට හුවමාරු කිරීමේ ක්‍රමය හඳුන්වනුයේ,
    1. E - music ය. 2. Sound Forge ය. 3. Modem ය. 4. Midi ය.

40. සංගීත නිර්මාණ කිරීම සඳහා බහුලව භාවිත කරන මෘදුකාංගයකි.
    1. Acid pro 2. Cubase 3. Adobe Audition 4. Pro tools